# පාඨමාලා විස්තර සටහන

# 2023

බලව,
මම සියල්ල
අලුත් කරමි
එළි 21:5





කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන
# 2023

සත්‍යය. යුක්තිය. කරුණාවන්ත බව. ගණන් දීම. විනිවිදභාවය. වත්මනේ ලාංකික කථිකාව සරසන යෙදුම් මෙවන් වෙයි. අපගේ දිවයිනෙහි වර්ධනය වන දැඩි සාපිපාසාව වන්නේ දේවරාජ්‍යයෙහි පදනම වන වටිනාකම් ය. ඒ හෙයින් වෙනදටත් වඩා,

> ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් ලෙස අන්ධකාර අවිනිශ්චිත කාලය ආලෝකවත් කළ යුතු වන්නේ දැන් ය.
>
> සභාව ලෙස අපට ඉච්ඡාභංගත්වයේ සෝෂාව මැද බලාපොරොත්තුවේ සුවිශේෂ හඬක් වන්නට යුතු කාලය දැන් ය.
>
> ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිරි ස්ත්‍රීන් හා පුරුෂයන් ලෙස අධෛර්ය වී, හදවතින් පසුබට වී සිටින ප්‍රජාවන්ට ලොව ඇති හොඳම පණිවුඩය රැගෙන ළඟා වීමට යුතු වූ කාලය දැන් ය.

පරාදෙසයක් බඳු අපගේ දිවයින ප්‍රතිස්ථාපනය වී නැවත යථා තත්ත්වයට පත් වීම දැකීමට ඔබ කැමති ද? උන් වහන්සේ සියල්ල අලුත් කරන බවට දේව වචනයේ පොරොන්දු වී ඇත්තේය. සභාව පරිවර්තනයේ නියෝජිතයන් ලෙස දේව වචනයෙන් හැඩ ගැසීම සඳහා ශික්ෂණ ප්‍රජාවක කොටසක් වීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙදී ඔබට අවස්ථාවක් ඇත.

2023 වසරේ දී කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට පැමිණ, අපි එක් ව ‘ක්‍රමයේ වෙනසක්’ ඇති කරමින් අපගේ ජීවිත කාලයටත් එයින් ඔබ්බටත් පවතින බලපෑමක් ඇති කරමු.


**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූනි සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ලේඛකාධිකාරී**<br>රන්මලී සෙනෙවිරත්න මෙනෙවිය | registrar@cts.lk |
| **සම්බන්ධීකාරක: ශාස්ත්‍රීය වැඩසටහන්**<br>මනීෂා සිල්වා මිය | maneesha@cts.lk |
| **ශිෂ්‍ය ගිණුම් කටයුතු** | student.accounts@cts.lk |
| **අධ්‍යයන ශිෂ්‍යත්ව** | scholarships@cts.lk |
| **පුස්තකාලය** | library@cts.lk |
| **තොරතුරු තාක්ෂණය**<br>නිර්මල ප්‍රනාන්දු මහතා | it@cts.lk |
| **ප්‍රායෝගික සේවා පුහුණුව**<br>ආචාර්ය සනත් අතුකෝරාළ | sanath@cts.lk |
| **උපදේශන වැඩසටහන්**<br>ඩිලිනි ඒබ්‍රහැම් මිය | counselling@cts.lk |
| **ශාස්ත්‍රපති වැඩසටහන්**<br>බර්නාඩ් කොස්තා මහතා | ma@cts.lk |
| **ශාස්ත්‍රීය ප්‍රවර්ධන අංශාධිපති**<br>ආචාර්ය මනෝ ඉමැනුවෙල් | mano@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැති රවින් කල්දේරා | ravin@cts.lk |
| **විදුහල්පති**<br>ආචාර්ය අයිවෝ පූබාලන් | ivor@cts.lk |

**+94 11 5524257 | www.cts.lk**

# පටුන

| | |
|---|---|
| | *පිටු අංකය* |
| **පොදු තොරතුරු** | **4** |
| **1 වාරය: ජනවාරි-අප්‍රේල්** | |
| කාල සටහන | **6** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **7 – 9** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **10 – 11** |
| **2 වාරය: අප්‍රේල්-ජුලි** | |
| කාල සටහන | **14** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **15 – 17** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **17 – 19** |
| කෙටි කාලීන පාඨමාලා | **20** |
| **3 වාරය: සැප්තැම්බර්-දෙසැම්බර්** | |
| කාල සටහන | **22** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **23 – 24** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **25 – 26** |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | **27 – 31** |
| **CTS පාඨමාලා විස්තර** | **32** |

# පොදු තොරතුරු

<u>**CTS පාඨමාලා:**</u>

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 24ක් වුවත් ඇතැම් ඒවායේ පැය 36ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 24ක පන්ති කාමර කාලයක්ද පැය 12ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

<u>**පාඨමාලා දේශන පැවැත්වීම:**</u>

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව GoogleMeet හරහා හෝ Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා යන දෙක මිශ්‍රව ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳව ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

<u>**CTS පාඨමාලා ගාස්තු:**</u>

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 5000/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලීත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

<u>**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**</u>

සම්පූර්ණ කරන ලද ලියාපදිංචි වීමේ අයදුම් පත https://www.cts.lk/online-registration/ හෝ ශිෂ්‍ය ගිණුම් අංශයට භාර දෙන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, ක්‍රෙඩිට් කාඩ් හෝ මුදලින් කළ හැකිය.
***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන්
ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

<u>**ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:**</u>

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2023 ජනවාරි 2***
***දෙවන වාරය: 2023 අප්‍රේල් 24***
***තෙවන වාරය: 2023 සැප්තැම්බර් 4***

කොහුවල CTS පරිශ්‍රයේදී ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය බාර දීම හා ගෙවීම් කරන්නේ නම් ඔබ එය කළ යුත්තේ වැඩකරන දිනයන්හි (සඳුදා සිට සිකුරාදා) උදේ 9:00 සිට සවස 4:30 දක්වා ය.

# 1 වාරය

# 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

○ පන්ති කාමරය තුළ | ◘ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 1 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **බයිබලයේ ශ්‍රේෂ්ඨ කාන්තා චරිත**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>චමිලා සුභාෂ් රණසිංහ | ○ **වත්මන් දූතනයේ ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>සනත් අතුකෝරාළ | ○ **මතෙව් තුමාගේ පොත**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **රෝම පොත**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ◘ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>ප්‍රබෝ මිහිඳුකුලසූරිය |
| දහවල් | ○ **ආත්මික සංග්‍රාමය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>විමලසේන ජයලත් | ○ **පොදු ගැටලු සඳහා උපදේශනය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ★ **යෞවන යෞවනියන් සඳහා සේවය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>නාමල් වීරසිංහ | ○ **බයිබලීය ආචාරධර්ම**<br>ප.ව.3:00-ප.ව.5:00<br>බර්නාඩ් කොස්තා | ○ **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:15<br>දුලිප් ප්‍රනාන්දු |
| සවස | ◘ **බහුත්ව සමාජයක ධර්මදූත සේවය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සුරංග අතුකෝරාළ | ○ **සියල්ලන්ටම ගැලපෙන අර්ථ විග්‍රහකිරීමේ උපකාරකයක්**<br>ප.ව.6:00-ප.ව.8:00<br>බර්නාඩ් කොස්තා | ◘ **පැරණි ගිවිසුමට හැඳින්වීමක්**<br>ප.ව.6:00-ප.ව.8:00<br>චමිලා සුභාෂ් රණසිංහ | ◘ **සභාව සහ අවසන් කාලය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සනත් අතුකෝරාළ | ★ **නමස්කාරය පිළිබඳ දේවවේදය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>රවින් කල්දේරා |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### බයිබලයේ ශ්‍රේෂ්ඨ කාන්තා චරිත

පැරණි හා නව ගිවිසුමේ සඳහන් ශ්‍රේෂ්ඨ කාන්තා චරිත පිළිබඳ අධ්‍යයනය කරයි. මෙහිදී විශේෂයෙන් දෙවිඳුන් සමඟ වූ සම්බන්ධතාවය, ඔවුන් ලද කැඳවීම හා ජීවත් වූ සමාජ වාතාවරණය සාකච්ඡා කෙරේ. මෙම පාඨමාලාව ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෑම දෙනාටම ප්‍රයෝජනවත් වේ.

සති 10 | BTh/Dip වෛකල්පික

දිනය: සඳුදා

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

### ආත්මික සංග්‍රාමය

"අපගේ සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොවේ" (එපීස 6:12). නපුරු ආත්ම සහ දුෂ්ට ආත්ම මහත් සේනා ගැන දේව වචනය දක්වා ඇත. කිතුනුවා සහ සභාව නිරන්තරයෙන්ම ආත්මික ගැටුමකට මැදිවී සිටියි. සාතන්ගේ සැලසුම් අබිබවා ජය ගැනීමට ඇවැසි දැනුම, සංග්‍රාමයේ ස්වභාවය තේරුම් ගැනීම සහ සන්නද්ධ වීම ආත්මික සංග්‍රාමය විෂයෙන් ලබාදේ.

සති 11 | BTh/Dip වෛකල්පික

දිනය: සඳුදා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: ජනවාරි 2

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### වත්මන් දූතනයේ ඉතිහාසය

වත්මන් ධර්මදූත සේවය ගවේෂණය කිරීමේදී 18 වන සියවසේ සිට අද දක්වා සැලකිලිමත් විය යුතුය. වැදගත් මිෂනාරිවරු, මිෂනාරි සංවිධාන සහ ධර්මදූතික උපාය මාර්ග අධ්‍යයනය කරන අතර ආසියානු කලාපය තුළ ධර්මදූත සේවය ගැන වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

සති 12 | BTh/Dip වෛකල්පික

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: ජනවාරි 3

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### පොදු ගැටලූ සඳහා උපදේශනය

දුක, ශෝකය, මානසික අසහනය, කාංසාව, හීනමානය, කේන්තිය, ඇබ්බැහිවීම් යනාදී දහසකුත් ප්‍රශ්නවල සමාජය ගිලී ඇත. මෙම ප්‍රශ්න ක්‍රිස්තියානි පවුල්වලට ද බලපායි. මෙවැනි වාතාවරණයක ගිලී සිටින පිරිසට අත්වැලක් වීමට අවශ්‍ය නිපුණතාව ඔබට ලැබෙනු ඇත.

සති 12 | BTh/Dip වෛකල්පික

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 3

සම්මාන: 3

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### මතෙව් තුමාගේ පොත

ග්‍රීක ලේඛන කලාවේ ශුභාරංචි ශෛලීය අද්විතීය වේ. ශුභාරංචි සතරේ සෑම එකකටම ඊට ආවේණික වූ හඬක් ඇත. මෙම පාඨමාලාව තුළ දී මතෙව් ශුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ විමසා බලනු ඇත. ඒවා අතර දේව රාජ්‍යය පිළිබඳ මූලික තේමාව, කන්ද උඩ දේශනාව සහ ජේසුස් වහන්සේගේ අනෙකුත් ඉගැන්වීම්, කැපී පෙනෙන උපමා කථා, එහි ව්‍යුහය සහ එහි ධර්මදූත පණිවුඩය වන්නේය.

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සති 12

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 4

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### රෝම පොත

අගෝස්තීනු, මාටින් ලූතර්, ජෝන් වෙස්ලි සහ කාල් බාත් යන අයගේ ජීවිත වල ගැඹුරු පරිවර්තනයකට මුල පිරූ පොතකි. ඉශ්‍රායෙල් ජාතියට හා සමස්ථ මැවිල්ලට දෙවිඳුන්ගේ මිදීමේ සැලැස්ම පාවුල් තුමා දක්වමින්, කුරුසිය තුළින් ප්‍රේමය හා සාධාරණත්වය පරිපූර්ණ කළ අයුරු මතුකරයි. මෙම පොත අධ්‍යයනය කිරීම තුළින් ඔබේ ජීවිතය ද පරිවර්තනය වනු නොඅනුමානය.

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### බයිබලීය ආචාරධර්ම

බයිබලීය ඇදහිල්ල ‘දැහැමි දිවියක්’ පිළිබඳව දැඩි අවධාරණයක් ඇති කරයි. සිනායි ගිවිසුම, දිවැසිවරුන්ගේ ලියවිලි, ප්‍රඥා සාහිත්‍යය, කන්ද උඩ දේශනාව යනාදියෙන් මතුවන ආචාරධර්මවල බලපෑම ද අලුත් ගිවිසුම් සභාවට ඒවා අදාළ කර ගන්නා ආකාරයද මෙම පාඨමාලාවෙන් විමර්ශනයට භාජනය කරනු ඇත.

**BTh/Dip අනිවාර්ය**

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

### ගීතාවලිය ගවේෂණය කිරීම

විලියම් වැන්ගැමරන් මෙසේ පවසයි: ‘ගීතාවලියේ කතුවරයා ආත්මයට ඔක්සිජන් සපයයි.’ ගීතාවලියේ වූ විවිධ ගීතිකා අර්ථකථනය කිරීම, වැලපීමෙන් දෙවියන් වහන්සේට කථා කරන ආකාරය, නමස්කාරය මෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ විස්තරය ආදි දේ ඉශ්‍රායෙල් ගීතිකා පොත ගවේෂණය කිරීමෙන් ඉගෙන ගත හැකිය.

**BTh/Dip වෛකල්පික**

සති 11

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: ජනවාරි 13

සම්මාන: 2

කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු**

1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

| ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III<br>20 වන ශතවර්ෂය<br>විසිවන සියවස ක්‍රිස්තියානි ශාසනයට ඉතා වැදගත් ය. පෙන්තකොස්ත ප්‍රගමනය, සාමයික ප්‍රගමනය, ශීතල යුද්ධය අතර බෙදුණු ලෝකයේ ක්‍රිස්තියානි සභාව, දෙවන වතිකානු සම්මේලනය වැදගත් ප්‍රවණතා වේ. මෙම ප්‍රවණතා හැදෑරීම තුළින් ඔබට වඩා බලපෑමක් ඇති කළ හැකි ගෝලීය කිතුනුවෙකු විය හැකිය. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සිකුරාදා<br>වේලාව: පෙ.ව. 9:00-11:15<br>ආරම්භය: ජනවාරි 13<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ප්‍රබෝ මිහිඳුකුලසූරිය** |
| --- | --- |

1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| යෞවන යෞවනියන් සඳහා සේවය<br>දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ පැවරුම භූගෝලීය වශයෙන් පමණක් නොව පරම්පරාවෙන් පරම්පරාවටද ව්‍යාප්ත විය යුතුය. ගෝලීයකරණය වී ඇති ලෝකය තුළ තරුණ හඬ සහ ජවය මිනිස් සමාජයේ ස්වභාවය උඩු යටිකුරු කරමින් පවතී. දේව රාජ්‍යය සඳහා වූ තාරුණ්‍යයේ ජවය සභාව විසින් බොහෝ දුරට නොසලකා හැර ඇත. මෙම පාඨමාලාව යොවුන් වියේ ගැටලු, නව යොවුන් වියේ අභියෝග මෙන්ම අවුරුදු 14 සිට 21 දක්වා තරුණ තරුණියන් ශුභාරංචියට නතු කරගෙන ශ්‍රාවකත්වයට ගොඩනගන්නේ කෙසේද යන්න ගවේෂණය කරයි. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව. 3:00-5:00<br>ආරම්භය: ජනවාරි 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **නාමල් වීරසිංහ** |
| --- | --- |

### 1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **සියල්ලන්ටම ගැලපෙන අර්ථ විග්‍රහකිරීමේ උපකාරකයක්**<br>බයිබලය පිළිබඳව පුදුමාකාර අන්තර් දැක්මක් ඇතැම් පුද්ගලයන්ට ඇත්තේ කෙසේදැයි ඔබ මවිත වුයේද? එය විජ්ජාවක් නොව පදගතාර්ථ සෙවීම හෙවත් අර්ථ විග්‍රහය නම් අමතර ක්‍රියාකාරකමක් කිරීමෙන් අත්පත්කරගත් දෙයකි. 'අර්ථ විග්‍රහය' යන යම් ඡේදයක පැහැදිලිකිරීමක් හෝ අර්ථ නිරූපනයක් වේ. මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ බයිබලය අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සහ මුලධර්මයන් ඔබට කියාදීමටත් පන්ති කාමරය තුළදීම ඒවා යොදගනිමින් පුහුණුවේ යෙදීමටත් කාලය ලබා දෙමිනි. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: අඟහරුවාද<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: ජනවාරි 3<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා** |

### 1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **බහුත්ව සමාජයක ධර්මදූත සේවය**<br>ගැළවීමට එකම මාර්ගය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේද? අන් අය ඇතුළත් නොකරන එවැනි උඩඟු පණිවිඩයක් වෙනත් ආගම් ලබ්ධිකයින් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වාදී සමාජයක ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මඟ පෙන්වනු ඇත. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සඳුද<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: ජනවාරි 2<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ** |

| | |
|---|---|
| **පැරණි ගිවිසුමට හැඳින්වීමක්**<br>පැරණි ගිවිසුමේ සෑම පොතක් පිළිබඳව එහි කතුවරයා අන්තර්ගතය, සැකිල්ල, ප්‍රධාන තේමා සහ ඓතිහාසික පසුබිම ආදී කරුණු පිළිබඳ සංක්ෂිප්ත දැක්මක් ලබාදෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් කියවන ලද බයිබලයේ ඇති විවිධ පොත් ඇගයීමට හා ඒවා රස විඳීමට හැකියාවක් ලැබෙන අතර පැරණි ගිවිසුම තේරුම් ගැනීමට මෙම පාඨමාලාව ඉමහත් රුකුලක් වනු ඇත. | **BTh/Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: බදාද<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: ජනවාරි 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය:<br>**චමිලා සුභාෂ් රණසිංහ** |

## 1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **සභාව සහ අවසන් කාලය**<br>සභාව යනු කුමක්ද? සභාව ලෙස අදහස් කෙරෙනුයේ ගොඩනැගිල්ලක්ද සම්ප්‍රදායක්ද නැතිනම් නමස්කාරයක්ද? අප හඳුනන ලෝකය අවසන් වන්නට යන්නේ කෙසේද? මෙම පාඨමාලාව හැදැරීමෙන් සභාවේ ක්‍රියාකාරීවීමටද අවසන් කාලය, ස්වර්ගය හා නිරය පිළිබඳ වැදගත් අවබෝධයක්ද ඔබට ලැබෙනු ඇත. | **BTh අනිවාර්ය**<br>**Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බ්‍රහස්පතින්ද<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: ජනවාරි 5<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ** |

## 1 වන වාරය | 2023 ජනවාරි 2 - අප්‍රේල් 1
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| | |
|---|---|
| **නමස්කාරය පිළිබඳ දේවවේදය**<br>වර්තමාන සභාව අන් කිසිදු නොවූ අයුරින් 'නමස්කාරය' කෙරෙහි උනන්දුවක් පෙන්නුම් කරයි. දෙවියන් වහන්සේට ගෞරවය ගෙනෙන්නාවූ නමස්කාරය පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්ද? පරණ ගිවිසුම පුරා ඇති යාග පූජා සහ ඉශ්රායෙලයේ ගීතිකාවන්ගේ සිට නව ගිවිසුමේ සභාවේ නමස්කාරය දක්වා තේමා සොයා, ඒවායේ ප්‍රායෝගික යෙදීම් අවබෝධ කරගැනීම මෙම පාඨමාලාවේදී සිදුවේ. ශුද්ධ ලියවිල්ල වෙතින් ගත් න්‍යායන් පදනම් කරගෙන ඔබගේ දේශීය සභාවේ නමස්කාරය ඇගයීමට ලක්කර වඩා සාරවත් කරගැනීමට ඔබට උපකාරී වන්නේය. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සිකුරාද<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: ජනවාරි 13<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

# 2 වාරය

# 2023 අප්‍රේල් 24 - ජූලි 31

○ පන්ති කාමරය තුළ | ◻ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
|---|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ශ්‍රී ලංකා සභා ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ජී පී වී සෝමරත්න \|<br>මධු මිහිරි ප්‍රනාන්දු | ○ **නෙහෙමියා පොත**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>සනත් අතුකෝරාළ | ○ **දූතනය පිළිබඳ දේවධර්මය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ◻ **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>ප්‍රබෝ මිහිඳුකුලසූරිය | ○ කෙටි කාලීන<br>**බිඳුණු හදට සුවය**<br>ජුනි<br>3-10-17-24<br>පෙ.ව.9:00-ප.ව.4:00<br>පත්මසීලි ගුණතිලක |
| දහවල් | ○ **කුඩා කණ්ඩායම් සේවය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>විමලසේන ජයලත් | ★ **අපයෝජනයට ලක්වූ දරුවන් වෙත සේවය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>ක්‍රිස්නි එදිරිසිංහ | ○ **ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>චමිලා සුභාෂ් රණසිංහ | ○ **එපිසවරුන්ට යැවූ හසුන**<br>ප.ව.3:00-ප.ව.5:00<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | | |
| සවස | ◻ **පලදායී නායකයන්ගේ පුරුදු 7ක්**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සුරංග අතුකෝරාළ | ◻ **නව ගිවිසුමේ පසුබිම**<br>ප.ව.6:00-ප.ව.8:00<br>බර්නාඩ් කොස්තා | ○ **බයිබලීය දේවධර්මය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>බර්නාඩ් කොස්තා | ◻ **කිතුනු දෙමාපියභාවය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සරත් ද සිල්වා | ★ **බයිබලීය අර්ථකථනය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජූලි 31

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ශ්‍රී ලංකා සභා ඉතිහාසය

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි උරුමය හැදෑරීමට අපූරු අවස්ථාවකි. ලංකාව තුළ කිතුනු දහමේ ආරම්භය, පෘතුගීසින්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන් හා ඇමෙරිකානු බලපෑම් තුළින් ක්‍රිස්තියානි සභාව හැඩ ගැසී වත්මන් සභාවේ විවිධත්වය ඇතිවූ ආකාරය ගවේෂණය කෙරේ.

BTh/Dip අනිවාර්ය

සති 10

දිනය: සඳුදා

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධු මිහිරි ප්‍රනාන්දු**

### කුඩා කණ්ඩායම් සේවය

සභාවක සාර්ථකත්වය රඳා පවතින්නේ එහි ඇති කුඩා කණ්ඩායම්වල බලපෑම මතය. බයිබල් අධ්‍යයන කණ්ඩායමක් සැකසීම, විෂය මාලාව සැකසීම, කුඩා කණ්ඩායමට නායකත්වය දීම තුළින් සභාවේ සාමාජිකයන්ගේ වර්ධනයට පංගුකාරත්වයක් දැරීමට මෙය අනගි අවස්ථාවකි.

BTh/Dip වෛකල්පික

සති 11

දිනය: සඳුදා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: අප්‍රේල් 24

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### නෙහෙමියා පොත

අද්විතීය නායකයෙකු පිළිබඳ සංක්ෂිප්ත, පුළුල් චරිත කථාවක් පරණ ගිවිසුමේ වෙන කිසිම පොතක දක්නට නැත. අතිශයින් මන බඳනා මෙම කථාන්දරය කියවීමෙන් ඔබට බයිබලීය නියමයන් පිළිබඳ වටිනා දැනුමක්ද ඒ තුළින් දර්ශනයක් ගොඩනැංවීම, අන් අය සංවිධානය කිරීම, ප්‍රශ්න හමුවේ නොසැලී සිටීම සහ අරමුණු ඉටු කරගැනීමට ඔබට මග පාද දෙයි.

BTh/Dip වෛකල්පික

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: අප්‍රේල් 25

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### දූතනය පිළිබඳ දේවධර්මය

දූතනය බයිබලය පුරා පැතිරී ඇති මාතෘකාවකි. ලෝකය පිළිබඳ දෙවියන් වහන්සේගේ කැමැත්ත උත්පත්ති 1 හි එළිදරව් කර ඇති අතර ලොවට ගැළවීම ගෙනෙන පොරොන්දුවක් උත්පත්ති 3 හි සඳහන් වී ඇත. ධර්මදූතනයේ තේමාව සොයා යෑමේදී ආබ්‍රහම්ගේ කැඳවීම, ඉශ්රායලයේ කැඳවීම, ජේසුස් වහන්සේගේ දූතනය, ක්‍රියා පොත මගින් ගෙනෙන දයකත්වය වැනි මාතෘකා මෙම පාඨමාලාවේදී හඳුනා ලැබේ.

BTh/Dip වෛකල්පික

සති 12

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: අප්‍රේල් 26

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය**<br>ළමයෙකුට හිතැති දේවස්ථාන පසුබිමක් බයිබලයානුකූලව ගොඩනැගීමට කාලීන අවශ්‍යතාවක් ඇත. සාකල්‍ය ළමා සංවර්ධනයක් තුළින් ළමයා, කිතුනු සභාව හා ළමා ධර්මදූත සේවය පිළිබඳ පුළුල් අවබෝධයක් හා ප්‍රායෝගික අත්දැකීමක් මෙම පාඨමාලාව සපයයි. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව. 3:00-5:00<br>ආරම්භය: අප්‍රේල් 26<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ** |

| | |
|---|---|
| **ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පසුගිය සියවස තුළ අන් කවරදටත් වඩා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ කථාබහ සහ සාකච්ඡා පිළිබඳ මහත් උනන්දුවක් ඇතිවී ඇත. ඉතිහාසය පුරා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ දේවවේදය ගොඩනැගුණු ආකාරය ද ශුද්ධ ආත්මයාණන් පිළිබඳව බයිබලය පවසන දේ ද ඉගෙන ගැනීමට අවස්ථාවකි. සභාව තුළත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුළත් ශුද්ධ ආත්මයාණන්ගේ සුවිශේෂී වූත් බලවත් වූත් ක්‍රියා පිළිබඳ දැනගැනීමට මහඟු අවස්ථාවකි. | **BTh/Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30<br>ආරම්භය: අප්‍රේල් 27<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

| | |
|---|---|
| **එපිසවරුන්ට යැවූ හසුන**<br>එපිසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන 'පාවුල් තුමාගේ පරමසාරය' ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව. 3:00-5:00<br>ආරම්භය: අප්‍රෙල් 27<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු** |

# 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජූලි 31
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>'ලෝක දැක්ම කණ්නාඩි කුට්ටමක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ' (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව. 9:00-11:15<br>ආරම්භය: අප්‍රේල් 28<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ප්‍රබෝ මිහිඳුකුලසූරිය** |

## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| | |
|---|---|
| **අපයෝජනයට ලක්වූ දරුවන් වෙත සේවය**<br>ලංකාවේ දරුවන් පිළිබඳ ඇති අවධානය ඉතාමත් විරළය. පසුගිය කාලයන්හි අනතුරු නිසා දරුවන් අකාලයේ ජීවිත අහිමිවීම අසන්ට දකින්ට ලැබිණි. ළමා අපයෝජනය යනු ප්‍රබල සමාජ ප්‍රශ්නයකි. රජයේ ඇස්තමේන්තු අනුව දවසකට දරුවෙකු අපයෝජනයට බඳුන්වෙයි. එවැනි දරුවන් හට සේවය කරන්නේ කෙසේදැයි මෙම පාඨමාලාව තුළින් ගවේෂණය කරයි. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: අඟහරුවාද<br>වේලාව: ප.ව. 3:00-5:00<br>ආරම්භය: අප්‍රේල් 25<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ක්‍රිස්ති එදිරිසිංහ** |

# 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජූලි 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **බයිබලීය දේවධර්මය**<br>පැරණි ගිවිසුමේ සහ නව ගිවිසුමේ ලියවිලි වට කොට ඇති ප්‍රධාන දේවධර්මය මෙම පාඨමාලාවෙන් හඳුනා ලැබේ. දෙවියන් වහන්සේ යනු කවුද, මුල් මැවිල්ලේ සිට නව මැවිල්ල දක්වා උන් වහන්සේගේ අද්විතීය සැලැස්ම දිගහැරෙන ආකාරය පිළිබඳ ඔබගේ දැනුම තියුණු කරනු ඇත. | **BTh අනිවාර්ය**<br>**Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: අප්‍රේල් 26<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා** |

## 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජුලි 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

| **පලදායී නායකයන්ගේ පුරුදු 7ක්**<br>නායකත්වය තනතුරක් නොව කර්තව්‍යයකි. කිතුනු නායකයන් මුහුණපාන විශාලතම අභියෝගය වන්නේ ඔහුට හෝ ඇයට දෙවියන් වහන්සේ විසින් පවරන ලද කර්තව්‍ය තුළ දිගුකාලීනව පලදායී වන්නේ කෙසේද යන්නයි. බයිබලීය දෘෂ්ටියක් සහිතව ස්ටීවන් කොවේ විසින් ලියන ලද 7 Habits of Effective Leaders නමැති පොත මෙම පාඨමාලාවේදී ගවේෂණය කරනු ඇත. පලදායී නායකයකු වීමට ඔබට එය උපකාර වනු ඇත. | **BTh/Dip වෛකල්පික**<br>සති 11<br>දිනය: සඳුදා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: අප්‍රේල් 24<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ** |
|---|---|

| **නව ගිවිසුමේ පසුබිම**<br>ක්‍රිස්තුස් වහන්සේ හා අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වූ සුවිශේෂී සිද්ධීන් හා ව්‍යාපාරයන් පිළිබඳ අන්තර් දෘෂ්ටියක් මෙම පාඨමාලාව තුළින් ලැබේ. අන්තර් ගිවිසුම් යුගයේ ජුදෙව් ආගම, එහි වැදගත් ප්‍රගමනයන්, වැදගත් ලිපි ලේඛන ගැන මෙන්ම පලස්තීනයේ සහ රෝම ලෝකයේ සංස්කෘතිය ගැනද මෙහිදී විමසා බැලේ. | **BTh/Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: අප්‍රේල් 25<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා** |
|---|---|

| **කිතුනු දෙමාපියභාවය**<br>බයිබලය තුළින් දෙමව්පියෙකු ලෙස දෙවියන් වහන්සේ දක්වන ආකාරයද ඇතිදැඩි කිරීම සම්බන්ධව එහි ඉගැන්වීම් ද මෙම පාඨමාලාවේදී සොයා බලනු ලැබේ. පෝෂණය, ආරක්ෂාව, විනය, උපදෙස් යනාදිය දරුවෙකුගේ වර්ධනයේ සෑම අවධියකදීම දෙමාපිය ආදරය තුළ තිබිය යුතුය. වඩා හොඳ දෙමාපියන් වීමට ඔබටත් ඒ සඳහා අන්‍යයන්ට මඟ පෙන්වීමටත් මේ පාඨමාලාව හැදෑරීම තුළින් හැකියාව ලැබේ. | **BTh/Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: අප්‍රේල් 27<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |
|---|---|

## 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජූලි 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| | |
|---|---|
| **බයිබලීය අර්ථකථනය**<br>බයිබලය සෑම පරම්පරාවක් උදෙසා වන දෙවියන් වහන්සේගේ නොවෙනස්වන වචනය බව කිතුනුවන්ගේ පිළිගැනීමයි. බයිබලය නියමිත ලෙස අර්ථකථනය කර එහි සත්‍යය නියමාකාරයෙන් උකහා ගැනීම අපට ඇති අභියෝගයයි. මෙම පාඨමාලාව තුළින් බයිබලයේ ඇති විවිධ සාහිත්‍ය පොත්: උදා. කාව්‍යමය, කථාන්දර, අනාගත වාක්‍ය සහ ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමට ඇවැසි මූලධර්ම සපයයි. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සිකුරාදා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: අප්‍රේල් 28<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු** |

## 2 වන වාරය | 2023 අප්‍රේල් 24 - ජූලි 31
# කෙටි කාලීන පාඨමාලා
## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **බිඳුණු හදට සුවය**<br>චිත්තවේගී ප්‍රකම්පනය යනු සුවවීමට කාලය ගතවන හදවතේ සහ මනසේ තුවාලයකි. එය අපගේ සෑම කොටසකටම: අපගේ සම්බන්ධතා, අපගේ ශරීර, අපගේ සිතුවිලි සහ අපගේ ඇදහිල්ල යනාදියට වේදනා ඇති කරයි. මෙම පාඨමාලාවේ පරමාර්ථය වන්නේ වේදනාකාරී හා කම්පන සහගත අත්දැකීම්වල බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ මෙම වේදනාවෙන් සුවය ලැබීමට ආරක්ෂිත ස්ථානයක් ලබා දීම මෙන්ම එම සුවවීමේ ගමන හරහා අනෙක් පුද්ගලයන්ට මඟ පෙන්විය හැකි පහසුකම් සපයන්නන් බවට පත් කිරීමට නායකයන් සන්නද්ධ කිරීමයි. | කෙටි කාලීන **BTh/Dip වෛකල්පික**<br>ජුනි මාසයේ සෙනසුරාදා 4ක්<br>දින: 3-10-17-24<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව.4:00<br>සම්මාන: 2<br>කථිකාචාර්ය:<br>**පත්මසිරි ගුණතිලක** |

# 3 වාරය

# 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2

○ පන්ති කාමරය තුළ | ☐ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 3 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **සාකල්‍ය ළමා සංවර්ධනය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>චමිලා සුභාෂ් රණසිංහ | ○ **ආසියාවේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>ජී පී වී සෝමරත්න | ○ **දේශනා ශිල්පය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සරත් ද සිල්වා<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **නායකත්වය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා \|<br>ලක්මාල් විජේරත්න<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>මහින්ද මුණසිංහ |
| දහවල් | ○ **එඬේර රැකවරණය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>විමලසේන ජයලත් | ○ **සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:00<br>සනත් අතුකෝරාළ | | ○ **ජොහන් ශුභාරංචිය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ඊන්ස්ටින් ප්‍රනාන්දු | |
| සවස | ☐ **වෘත්තිය පිළිබඳ ආචාරධර්ම**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සුරංග අතුකෝරාළ | ○ **දේවධර්මයට හැඳින්වීම**<br>ප.ව.6:00-ප.ව.8:00<br>ෂර්ලි ෆේබර් | ☐ **ප්‍රධාන දේවධර්මවේදීන්**<br>ප.ව.6:00-ප.ව.8:00<br>බර්නාඩ් කොස්තා | ☐ **අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සනත් අතුකෝරාළ | ★ **අධ්‍යයන ක්‍රමවේද**<br>ප.ව.6:00-ප.ව.8:15<br>රවින් කල්දේරා<br>☐ **තෙසලෝනික හසුන්පත්**<br>ප.ව.6:00-ප.ව.8:15<br>ක්‍රිස්නි එදිරිසිංහ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 3 වන වාරය | 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### සාකල්‍ය ළමා සංවර්ධනය

දේශයක මෙන්ම සභාවේ ද අනාගත බලාපොරොත්තුව ළමයින් ය. මෑත යුගයේ සාකල්‍ය ළමා සංවර්ධනයට පදනම වී ඇත්තේ බයිබලීය මූලධර්මයන් ය. ළමුන්ගේ වර්ධනීය මූලධර්මයන් වන ශාරීරික, මානසික, චිත්තාවේගීය, සමාජීය සහ ආධ්‍යාත්මික යන අංශ පහ ඔස්සේ අධ්‍යයනයේ යෙදේ. කිතුනු කැඳවීම තුළ ළමුන් හැඩගස්වා වර්ධනය කරන්නේ කෙසේදැයි ඉගෙනීමට මං පාදයි.

**BTh/Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුදා

වේලාව: පෙ.ව. 9:00-11:15

ආරම්භය: සැප්තැම්බර් 11

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

### එඬේර රැකවරණය

පරණ ගිවිසුමේ පටන් අවධාරණය වන දේව සෙනඟට රැකවරණය සඳහා නායකයකු, එඬේරෙකු හෝ රැකවල්කරුවෙකු හෝ අවශ්‍ය බව පෙනේ. නායකත්වයෙහි සිටින්නන් තම සේවා අවශ්‍යතාවලදී එඬේර රැකවරණය සැලසීමට සූදානම්ව සිටිය යුතුවේ. සුවිශේෂී එඬේර රැකවරණ සේවාවන් විමසා බලන අතර එයට ආත්මික පෝෂණය, බැහැදැකීම, විනය හා ප්‍රතිස්ථාපනය, බෞතීස්මය, මංගල්‍යය හා අවමංගල්‍ය අවස්ථාවලදී උපස්ථානය යන දෙය ද ඇතුළත්ය.

**BTh/Dip වෛකල්පික**

සති 12

දිනය: සඳුදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### ආසියාවේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය

අපගේ කලාපය තුළ දෙවියන්වහන්සේ විසින් කරන ලද ක්‍රියාවන් පිළිබඳ අධ්‍යයනයට අනඟි අවස්ථාවකි. ආසියාතිකයන් ලෙස අපගේ පණිවිඩය හා කාලීන අදාළත්වය අවබෝධ කරගැනීමට ආසියාවේ කිතුනු ඉතිහාසය උගනීම වැදගත් වන්නේය.

**BTh/Dip වෛකල්පික**

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: සැප්තැම්බර් 5

සම්මාන: 2

කථිකාචාර්ය:**ජී පී වී සෝමරත්න**

### සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම

ඔබ ඉරුදින පාසලේ, තරුණ කණ්ඩායම්වල, බයිබල් අධ්‍යයන කණ්ඩායම් වැනි දේවල ඉගැන්වීමේ නිරතව සිටින්නේ නම් ඔබ කිතුනු අධ්‍යාපනයේ කොටස්කරුවෙකි. ඉගැන්වීම පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි මෙම පාඨමාලාවේදී ඔබට දැනගත හැකිය. ජීවිත වෙනස් කරන ලෙස ඔබ අපේක්ෂිත කණ්ඩායම පලදායි ලෙස ඉගැන්වීමට ගැළපෙන පුහුණුවක් සකස්කර ගැනීමට මෙහිදී ඔබට උගන්වනු ලැබේ.

**BTh/Dip වෛකල්පික**

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: සැප්තැම්බර් 5

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 3 වන වාරය | 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### දේශනා ශිල්පය

පොදු නමස්කාරයේ කේන්ද්‍රස්ථානයක් වනුයේ දේශනය යි. දේශනාවේ තිබිය යුතු ආවේගාත්ම බව ද වෙනසක් ඇති කරලීමේ හැකියාව ද සහිතව දේශනා කරන්නේ කෙසේද? දෙවියන් වහන්සේගේ වචනය බලවත් ලෙස සන්නිවේදනය කිරීමට ඇවැසි මූලික ලක්ෂණයක් වූ දේශනාව සැකසීම ද දේශනා කිරීමේ කලාව ද ඉගෙනීමට අපූරු අවස්ථාවකි.

සති 12 | **BTh/Dip වෛකල්පික**

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: සැප්තැම්බර් 6

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

### නායකත්වය

***බයිබලයෙන් නායකත්වය ඉගෙනීම***

නායකත්වය පිළිබඳ විවිධ අදහස් වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අප බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

සති 11 | **BTh/Dip අනිවාර්ය**

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා** | **ලක්මාල් විජේරත්න**

### ජොහන් ශුභාරංචිය

ලියොන් මොරිස් මෙසේ පවසයි: “ජොහන් ශුභාරංචිය යනු කුඩා ළමයකුට දිය මත ඇවිදිය හැකි වූත් හස්තියකුට දිය නෑ හැකිවූත් තටාකයකි.” මෙම මාහැඟි ශුභාරංචි පොත තුළ ජොහන් තුමා ජේසුස් වහන්සේගේ ඓතිහාසිකත්වය ද උන් වහන්සේගේ පෘථුල ඉගැන්වීම ද ගෙන හැර දක්වයි. ඉතා වැදගත් ක්‍රිස්තියානි ධර්මනියාම ගවේෂණය කරමින් ශ්‍රාවකත්වය සඳහා විප්ලවීය කැඳවීමක් ජොහන් තුමා කරයි.

සති 11 | **BTh/Dip වෛකල්පික**

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

### මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය

***බයිබලීය භාරකාරත්වය ඉගෙනීම***

මෙම පාඨමාලාව තුළින් මුදල්, ඉතිරිකිරීම්, ආයෝජනය, ණය, දීම, ‘සමෘද්ධිමත් ශුභාරංචිය’, තපස්කම සහ ස්වර්ගීය විපාක යන මාතෘකාවන්ට අදාළ දේව වචනයේ පාඨ හඳුරනු ලැබේ. ඔබගේ ජීවිතයේ සඳතනයටම බලපාන භාරකාරීත්වය පිළිබඳ බයිබලීය දැක්මක් ඇති කරලීම මෙහි අරමුණයි.

සති 11 | **BTh/Dip වෛකල්පික**

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව. 9:00-11:15

ආරම්භය: සැප්තැම්බර් 8

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

**3 වන වාරය | 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2**

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### වෘත්තිය පිළිබඳ ආචාරධර්ම

දෙවියන් මනුෂ්‍යයා මැවීමෙහි පරමාර්ථය වෘත්තියක නියැළෙමින් සමාජය ගොඩනැංවීමෙහි යෙදීමටය. බොහෝ දෙනෙකුගේ ජීවිතයෙන් අර්ධයක් පමණ ගෙවන්නේ කාර්යාලයේ බැවින් දේව මෙහෙවර සඳහා ස්වකීය වෘත්තිය යොදගැනීමට ද ක්‍රිස්තු කේන්ද්‍රී වෘත්තිමය ආචාරධර්ම මගින් දේව රාජ්‍යයේ වටිනාකම් ප්‍රවර්ධනය කිරීමට ද අත්වැලක් සපයයි.

සති 12 | **BTh/Dip වෛකල්පික**

දිනය: සඳුද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### ප්‍රධාන දේවධර්මවේදීන්

කිතුනු සම්ප්‍රදය වනාහි චින්තකයන් රාශියකගේ අදහස් වලින් පෝෂණය වී ඇත්තේය. ඔවුන්ගේ චින්තාවන් දේව වචන අර්ථ විවරණ කිරීමට, ධර්මනියාමක ගොඩ නැංවීමට, ගීතිකා හා යාච්ඤාවන් මෙන්ම ආචාරධර්මය අභියෝගයට මහත් සේ ඉවහල් වේ. අද්‍යතන ජීවිතයේ කිතුනුවන් මුහුණදෙන ගැටලූ සඳහා කිතුනු චින්තනයන්ගේ ආභාසය මෙම පාඨමාලාවේ ගවේෂණය කෙරේ.

සති 12 | **BTh/Dip වෛකල්පික**

දිනය: බදාදා

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: සැප්තැම්බර් 6

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

### අපෝස්තුලූවරුන්ගේ ක්‍රියා පොත

ලූක් තුමාගේ දෙවන කෘතියෙන් මුල් කිතුනු ප්‍රජාවන්ගේ ආරම්භය දැක්වෙයි. සෑම කිතුනු පරම්පරාවක්ම තම අනන්‍යතාවය, දූතනය සහ සංවිධානය හැඩගස්වා ගැනීමට ක්‍රියා පොතෙන් පරමාදර්ශ ලබා ගැනීමට උත්සාහ ගෙන ඇත. පළමු සියවසේ ඓතිහාසික සන්දර්භය තුළින් ක්‍රියා පොත කියවා ලූක් තුමා ඉදිරිපත් කරන ප්‍රධාන තේමාවන් මෙම පාඨමාලාවෙන් අධ්‍යයනය කෙරේ. ක්‍රියා පොතේ කිතුනු ප්‍රජාව අත්දුටු අධ්‍යාත්මික හා සමාජීය සංවර්තනය, අභියෝග හා දූතන රටාවන් අද සභාවන්ට අදළ කර ගත හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කෙරේ.

සති 11 | **BTh/Dip වෛකල්පික**

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### තෙසලෝනික හසුන්පත්

තෙසලෝනික සන්දේශවල මූලික අරමුණ පීඩා මැද සිටින ඇදහිලිවතුන් දිරිගැන්වීමත්, දුර්මත නිවැරදි කිරීමත්ය. සත්‍ය ඇදහිල්ල කිතුනු ප්‍රජාවට බලාපොරොත්තුවත්, ප්‍රේමයත්, අන්‍යෝන්‍ය කෘතඥතාවයත් ගෙනදේ. වත්මන් යථාර්ථයට අරුතක් සපයන ක්‍රිස්තුස් වහන්සේගේ දෙවැනි පැමිණීමේ අපේක්ෂාව මෙම සන්දේශවලින් මතු කෙරේ. මෑත ඉතිහාසයේ මෙම පොත පිළිබඳ මතුවූ විචාරක මතයන් පිළිබඳවද අවධානය යොමු කෙරේ.

සති 11 | **BTh/Dip වෛකල්පික**

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

## 3 වන වාරය | 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **දේවධර්මයට හැඳින්වීම**<br>අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩා පැහැදිලි වන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පෑදීමක් කරයි. | **BTh/Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව. 6:00-8:00<br>ආරම්භය: සැප්තැම්බර් 5<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්** |

## 3 වන වාරය | 2023 සැප්තැම්බර් 4 - දෙසැම්බර් 2
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය


| | |
|---|---|
| **අධ්‍යයන ක්‍රමවේද**<br>අධ්‍යයන ක්‍රමවේද කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙවරෙහි දක්වන කරුණක් වන්නේ 'උසස්ම ශාස්ත්‍රීය ප්‍රමිතියට අනුව...' අපගේ පුහුණුව කරන බවය. එහෙයින් මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ විෂය නිර්දේශයන්හි අවශ්‍යතාවන් පැහැදිලි කර දෙන අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුවෙකු ලෙස විශිෂ්ටත්වයට පත් වීමට ඇවැසි සටහන් තබාගැනීමේ හැකියාව, වේගයෙන් කියවීම, පර්යේෂණ කිරීම, රචනා ලිවීම ආදී කුසලතාවන්ගෙන් ඔබ පූර්ණ කරනු ලබයි. | **BTh/Dip අනිවාර්ය**<br>සති 11<br>දිනය: සිකුරාදා<br>වේලාව: ප.ව. 6:00-8:15<br>ආරම්භය: සැප්තැම්බර් 8<br>සම්මාන: 0 (2)<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනි සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබද ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**විමලසේන ජයලත්,** BTh, LDD, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. සිව්චතුරස්‍ර සභාවේ මධ්‍යම පළාතේ වැඩ බලන දේවගැතිවරයා ලෙස ද එම සභාවේ කමිටු සාමාජිකයෙකු හා කිතුනු අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද සේවය කරයි.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාත්මික ගොඩනැගීම් සම්බන්ධීකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරයෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.




**ඒන්ස්ටීන් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.


# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**රවින් කල්දේරා,** DipAgri, BTh, BA , MA
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දායකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**බර්නාඩ් කොස්තා,** BTh, MDiv
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සම්බන්ධීකාරකවරයාය.** ඉන්දියාවේ COTR දේවධර්ම ශාස්ත්‍රාලයේ, පිලිපීනයේ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ උපාධිලාභියකි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධි අධ්‍යයන මධ්‍යස්ථානයේ පීඨාධිපති ලෙස සේවය කළ මෙතුමා වර්තමානයේ විවිධ වූ මට්ටම්වල සභා නායකත්වය ගොඩනැගීමෙහි යෙදී සිටින්නේය. කල්වාරි දේවස්ථානයේ සාමාජිකයෙකි.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.



**ප්‍රබෝ මිහිඳුකුලසූරිය,** PgDipM (CIM), MA, PhD
වැන්කුවර්හි රීජන්ට් විද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකු වේ. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු උප විදුහල්පතිය. එතුමාගේ ආචාර්ය උපාධි නිබන්ධනය වූයේ බ්‍රිතාන්‍ය ක්‍රිස්තියානි මානුෂීයත්වය සහ ශ්‍රී ලාංකේය නිදහස් ව්‍යාපාරය සම්බන්ධවය. ගුරුවරයෙකු ලෙස එතුමා උත්සාහ දරන්නේ ඉතිහාසය සහ දේවධර්මය යන ක්ෂේත්‍ර තුළින් වෙළඳපොළ, ශාස්ත්‍රීය ලෝකය සහ ප්‍රජා ජීවිතය තුළ දේව රාජ්‍යය වෙත යොමුවූ ගෝලත්වය පෝෂණය කිරීම ය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**නාමල් වීරසිංහ,** BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමග සංවිධානයේ හි (Youth For Christ) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**සුරංග අතුකෝරාළ,** ADCN, DIM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේවසභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන හෙතෙම වර්තමානයේ ජීවිතාලෝකය හි උපදේශක/පරිපාලක සහ මානව සම්පත් කළමනාකරු වශයෙන්ද කටයුතු කරන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



**ජී පී වී සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු පර්යේෂණ අංශ භාර මහාචාර්යතුමාය.**
විපුල ඵලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ටෲමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**මධු මිහිරි ප්‍රනාන්දු,** Dip MME, BA, MA

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කරමින් උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙය වන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සම්පූර්ණ ගිහි දේශිකාවකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh, MA (candidate)

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව “ශ්‍රී ලංකා ළමා ධර්මදූන සහභාගිත්වයේ” (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත. ඇය පිලිපීනයේ ආසියා-ශාන්තිකර නසරීන දේවධර්ම ශාස්ත්‍රාලයේ (APNTS) සාකල්‍ය ළමා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ අවසාන පර්යේෂණ නිබන්ධනයේ කටයුතුවල නියැලෙන්නීය.



**සරත් ද සිල්වා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා කෙෂ්ත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමී සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**පත්මසීලි ගුණතිලක,** BA, MA

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි හැදෑරූ උපාධිධාරිනියක් වන අතර, පිලිපීනයේ ජාත්‍යයන්තර උපාධි විද්‍යාලයේ ද උපාධිධාරිනියකි. ශ්‍රී ලංකා කැම්පස් කෲසේඩ් ආයතනයේ වසර 14ක කාලයක් ගෝලයන් ගොඩ නැගීම සහ නායකයන් පුහුණු කිරීමේ සේවය තුළ ද නිරතවිය. පූජක භාර්යාවක් ලෙස ද, සභාවේ දේශනා කිරීම ඇතුළු විවිධ සේවයන් වල ද නිරතවූවෙකි. ශ්‍රී ලංකා බයිබල් සංගමය සමග වසර 8ක පමණ කාලයක්; කම්පනයට පත් දරුවන්, නවයොවුන් දරුවන් හා වැඩිහිටියන් සුවපත් කිරීමේ ප්‍රධාන පහසුකම් සලස්සන්නෙක් ලෙස ද සේවය කර අත්දැකීම් ලැබූවෙකි. (Master Facilitator (HWOT) – ‘Healing the Wounds of Trauma’ for Children, Teenagers and Adults)



**ලක්මාල් විජේරත්න,** BTh

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ සභාපාලකවරයකු ලෙස වසර 17ක් විවිධ පළාත්වල සේවය කර ඇත. වර්තමානයේ සභාවේ සේවා භාර උපසභාපති වේ. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර මේ වන විට MAC අධ්‍යයන කටයුතු සිදු කරයි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මහින්ද මුණසිංහ,** BTh, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෲසෙඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පුර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටී.



**ෂර්ලි ෆේබර්,** BTh

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ හසල අත්දැකීමක් ඇති දේවගැතිවරයකු මෙන් ම, වර්තමානයේ මහා නායකතුමන් ද වෙයි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධිධාරියෙකි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ (හිටපු) සාමාජිකයෙකි.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ තුනක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවා) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 108කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***

අධ්‍යයන කාර්යාලය
011 5524257; registrar@cts.lk; www.cts.lk

# පුනරුත්ථානය

පරාදෙසයක් බඳු අපගේ දිවයින
ප්‍රතිස්ථාපනය වී නැවත යථා තත්ත්වයට පත් වීම
දැකීමට ඔබ කැමති ද?
උන් වහන්සේ සියල්ල අලුත් කරන බවට
දේව වචනයේ පොරොන්දු වී ඇත්තේය.
සභාව පරිවර්ථනයේ නියෝජිතයන් ලෙස
දේව වචනයෙන් හැඩ ගැසීම සඳහා
ශික්ෂණ ප්‍රජාවක කොටසක් වීමට
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙදී ඔබට අවස්ථාවක් ඇත.

2023 වසරේ දී කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට පැමිණ,
අපි එක් ව 'ක්‍රමයේ වෙනසක්' ඇති කරමින්
අපගේ ජීවිත කාලයටත්
එයින් ඔබ්බටත් පවතින බලපෑමක් ඇති කරමු.

189 දුටුගැමුණු විදීය, කොහුවල | 011 5524257 | registrar@cts.lk | www.cts.lk